# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## පුරප්පාඩු

මෙහි පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : වෙරළබඩ පහන් පරීක්ෂක

(අ) වැටුප :

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 7:3 (T 3) |
| මූලික වැටුප | : | රු. 37,330/= |
| වාර්ෂික වේතනාධිකය | : | රු. 805/= |

(දළ වැටුප මාසිකව රු. 80,000/= ක් පමණ වේ.)

(ආ) **යෝග්‍යතාවය :**

අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී එකවර විෂයයන් 03 කින් සමත් විය යුතු අතර, අ:පො:ස (සා. පෙළ) විභාගයේදී ගණිතය හා විද්‍යාව විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව ඉංග්‍රීසි භාෂාව සමත්ව තිබීම.

**සහ**

විදුලි/විද්‍යුත් ක්ෂේත්‍රයට අදාළව හතරවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 04) හෝ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

**සමග**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විදුලි/විද්‍යුත් ක්ෂේත්‍රයේ කාර්මික ශිල්පියෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද

(ඇ) **අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :**

i. සාමාන්‍ය ආරක්ෂාව – ප්‍රථමාධාර පිළිබඳ සහතිකය

ii. පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම පිළිබඳ සහතිකය

iii. ගිනි නිවීම හා ගිනි වැළැක්වීම පිළිබඳ සහතිකය

iv. වැඩබිමේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සහතිකය

(ඈ) **වෙනත් සුදුසුකම් :**

පිහිනීමේ හැකියාව තිබිය යුතුය.

සියලුම වෙරළබඩ පහන් සම්බන්ධයෙන් වූ යාන්ත්‍රික කාර්යයන් පිළිබඳ අවබෝධය

(ඉ) **වයස් සීමාව :**

අවුරුදු 18–45 අතර විය යුතුය.

(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

**සටහන :**

i අවශ්‍ය වුවහොත් සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලිඛිත/ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.

ii. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

**සැලකිය යුතුයි :**

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියලුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියාකළ යුතුය.
- තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.
- අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග **"ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන), මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13"** යන ලිපිනයට ලැබෙන සේ 2024.03.28 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"වෙරළබඩ පහන් පරීක්ෂක තනතුර සඳහා"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.
- **අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සභාපති**